**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය -2020**
---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.**

**1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

**සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,**

- **වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.**

- **අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.**

- **කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.**

- **සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.**

- **හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.**

**හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.**

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලටඅනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 02 හි 9 වන වගන්තිය ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු වටිනාකමට අගය කර මූල්‍ය ප්‍රකාශවල දැක්විය යුතු වුවද, මාධ්‍ය ජාලය විසින් තොගයේ ඇතුළත් අමතර කොටස්වල, ශුද්ධ උපලබ්ධි අගය ඇස්තමේන්තු කිරීමකින් තොරව පිරිවැයට රු.17,146,371ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | ගබඩාවේ පවත්වා ගෙන යන මෙම තොගය නැවත විකිණීම සඳහා හෝ නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමක් සිදු නොවේ. මෙය ලාභ ඉපයීමේ පරමාර්ථයක් නොමැතිව පරිභෝජනය සඳහා මෙම තොගය පවත්වා ගෙන යනු ඇත. ආයතනයේ අවශ්‍යතාවය මත මිලදී ගැනීම සිදු වන අතර, වැඩි කාලයක් ගබඩාවේ රඳවා තබා ගැනීමක් සිදු නොවන බැවින් පිරිවැය අගයට දක්වා ඇත | ගිණුම්කරන ප්‍රමිත ප්‍රකාරව තොගයේ වටිනාකම වාර්තා කල යුතු ය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 13 ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කල එහෙත් තව දුරටත් මෙහෙයුම් කටයුතු සඳහා භාවිත කරනු ලබන දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කර ඒවායේ ධාරන අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවද, මාධ්‍ය ජාලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති එහෙත් භාවිතයේ පවතින රු. 1,652,337,093 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ධාරන අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | LKAS 16 දේපල, පිරියත හා උපකරණ ප්‍රමිතියේ ඡේද අංක 79 (B) අනුව සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති නමුත්,දැනට භාවිතා කරන දේපල, පිරියත හා උපකරණ වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇත. විගණන කටයුතු සඳහා එම වාර්තාවේ මෘදු පිටපතක් ලබා දී ඇත. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු ය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 අනුව ක්ෂයකලහැකි වත්කම් වෙනුවෙන් ලැබෙන රාජ්‍ය ප්‍රදාන ක්ෂය වියදම ලෙස | රජයේ ප්‍රදානයන් මත ගන්නා වත්කම් ක්‍රමක්ෂය කරනුයේ (SLAS 18) එම වත්කම් උපයෝජනය කරනු ලබන ආකාරය මත වන | ප්‍රාග්ධන ප්‍රදාන ක්ෂය වියදමට අනුරූපිව ආදායමක් ලෙස හඳුනා |

| | | |
|---|---|---|
| හඳුනා ගන්නා ලද අවස්ථාවේදී ඊට අනුරූපීව ආදායම ලෙස හඳුනා ගතයුතු වුවද මාධ්‍ය ජාලය විසින් **2020** වර්ෂය තුළදී වසන්තම් ටීවී නාලිකාව සඳහා ලැබුණු රු. **5,100,000** ක ප්‍රාග්ධන ප්‍රදාන ක්ෂය වියදමට අනුරූපීව ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. | අතර, ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව මිලදී ගත් වර්ෂයට පසු වර්ෂයේ සිට ක්ෂය කිරීම සිදු කරයි. එම ප්‍රතිපත්තියට අනුව වසන්තම් ටී.වී. නාලිකාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ (**2020** වර්ෂයේ) ලැබූ ප්‍රදානයන් **2021** වර්ෂයේදී ක්‍රමක්ෂය කරනු ඇත. ඒ අනුව පොදු ප්‍රතිපත්තියකට අනුව ආයතනයේ ගිණුම් කටයුතු සිදු වන බව දන්වන අතර, ඒ අනුව ගිණුම් කටයුතු නිවැරදිව සිදු කර ඇති බව දන්වමි. එලෙසම රජයේ බදු ප්‍රදානයන් පිළිබඳ සියළුම තොරතුරු ලබා දී ඇත | ගත යුතු ය. |

**1.5.2** ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලය විසින් වත්කම් ක්ෂය කිරීම මිලදී ගත් මස සිට සිදු කර තිබුන ද මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය ප්‍රතිපත්තිය පැහැදිලිව හෙළිදරව්කර නොතිබුණි. | ක්ෂය ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක **2.8.1** යටතේ දක්වා ඇත. | ක්ෂය ප්‍රතිපත්තිය පැහැදිලිව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කල යුතු ය. |
| (ආ) මාධ්‍ය ජාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව යන්ත්‍රෝපකරණ ප්‍රයෝජනවත් ආයු කාලය වසර **2** ත් **15** ත් අතර (ක්ෂය ප්‍රතිශතය **6.67%** ත් **50%** ත් අතර) වුවද ස්වාධීන රූපවාහිනි සේවයේ පිරිවැය රු. **421,567,609** ක් වූ යන්ත්‍රෝපකරණ හා ලක්හඬ ගුවන් විදුලියේ පිරිවැය රු. **1,058,945**ක **TELEPHONE HYBRID SYSTEM** ක්ෂය ප්‍රතිපත්තියට පටහැනි ලෙස ක්ෂය ගණනය කර තිබුණි. | වර්තමානයේ ක්ෂය අගයන් වාර්ෂිකව පරීක්ෂා කරනු ලබන අතර අදාළ ක්ෂය ගැලපීම් ඒ අනුව සිදුවන බැවින් ක්ෂය ප්‍රතිශතය වෙනස් වේ. ඒ අනුව මෙය නිවැරදිව ගිණුම් ගත කර ඇති බව දැක්විය හැක. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කල යුතු ය. |
| (ඇ)මාධ්‍ය ජාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව කාර්යාල උපකරණ පිරිවැයට සියයට **25** බැගින් ක්ෂය කළ යුතු වුව ද ඊට පටහැනි ලෙස ස්වාධීන රූපවාහිනි සේවය විසින් **2014** වර්ෂයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු.**85,150** වූ ජංගම දුරකථන සියයට **12.5** බැගින් ක්ෂය කිරීම හේතුවෙන්, මාධ්‍ය ජාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට සම්පූර්ණයෙන් ක්ෂය වියයුතු එම වත්කම්වල ශුද්ධ අගය රු. **13,305** කින් අගය වැඩියෙන් දක්වා තිබුණි. | පෙර වර්ෂ වලදී ජංගම දුරකථන, ලී බඩු හා සවිකිරීම් යටතේ දැක්වූ නිසා ක්ෂය ප්‍රතිශතය **12.5 %** වූ අතර, ඉන්පසු එය කාර්යාල උපකරණ යටතේ දක්වා **25 %** ක්ෂය ප්‍රතිශතයට අනුව ගැලපීම් සිදු කරන ලදී. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කල යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) මාධ්‍ය ජාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව ගොඩනැගිලිවල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 20 ක් වුවද ලක්හඬ ගුවන් විදුලිය විසින් ගොඩනැගිලි වල ප්‍රයෝජනවත් ආයු කාලය වසර 25 ක් ලෙස සලකා ක්ෂය ගණනයකර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ක්ෂය වටිනාකම රු.64,683 ක් අඩුවෙන් හා නිවැරදි ආකාරයට ක්ෂය අනුපාත යොදා නොගැනීම නිසා 2020 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වටිනාකම රු.1,044,263 කින් වැඩියෙන් දක්වා තිබුණි. | ලක්හඬ ගුවන්විදුලිය ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව යටතේ පවතින විට පැවති ආයු කාලයටම ස්වාධීන රූපවාහිනිය යටතට පවරාගත් පසුද වෙනස් නොකර පවතී. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කල යුතු ය. |
| (ඉ) මාධ්‍ය ජාලයේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව කාර්යාල උපකරණ පිරිවැයට සියයට 25 බැගින් ක්ෂය කළ යුතු වුව ද ලක්හඬ ගුවන් විදුලිය විවිධ අනුපාත මත කාර්යාල උපකරණ ක්ෂය ගණනය කිරීම හේතුවෙන්, මේ වනවිට සම්පූර්ණයෙන් ක්ෂය විය යුතු 2012, 2013 හා 2014 වසරවල මිලදීගත් කාර්යාල උපකරණ වල 2020 දෙසැම්බර් 31 දිනට ශුද්ධ අගය රු 260,578 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2012 වර්ෂයේ සිට ගිණුම්කරණ ප්‍රමිතීන් වෙනස් විය. IFRS ප්‍රමිතීන්ට අනුව සෑම වත්කමකම ආයු කාලය අනුව ක්ෂය කරන අනුපාතය තීරණය කළ යුතු බැවින් එක් එක් වත්කමේ ආයු කාලය අනුව අනුපාත වෙනස් වේ | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කල යුතු ය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාජ මාධ්‍ය ජාල හරහා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකු කාඩ් පතක් මගින් 2019 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව සිදු කරන ලද ගෙවීම් රු.202,309ක් සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස දක්වා තිබීම හේතුවෙන් ව්‍යාපාර ප්‍රවර්ධන වියදම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | සමාජ මාධ්‍ය ජාලා හරහා වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා බැංකු කාඩ්පත් යොදා ගන්නා අතර මෙම කාඩ්පතේ පෙර වර්ෂයේ අවසන් මාස වලට අදාළ වියදම් පියවීම ඊට පසු වර්ෂයේදී සිදු කරනු ලබයි. මෙය වර්ෂ අවසානයේ නිවැරදිව ගැලපීම සඳහා සටහන් කර ගන්නා ලදී | වර්ෂයට අදාල වියදම් පමණක් වර්ෂයේ වියදම ලෙස දැක්විය යුතු ය. |
| (ආ) එකම ණයගැතියෙකු වෙනුවෙන් එකම ගනුදෙනුව සඳහා මාධ්‍ය ජාලය විසින් ලෙජර් ගිණුම් දෙකක් නඩත්තු කර තිබුණු අතර එම ණයගැතියා විසින් ගෙවන ලද මුදල වූ රු. 2,427,600 ක් එක් ගිණුමකට සටහන් කර තිබුණි.ඒ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ණයගැති ශේෂය සහ රඳවාගත් ඉපයුම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | ඩේවිඩ් පීරිස් මෝටර් කම්පැනි ලිමිටඩ් නමින් හා ඩේවිඩ් පීරිස් කම්පැනි නමින් එකම කොන්ත්‍රාත් අංකය යටතේ ගිණුම් දෙකක් නිර්මාණය වී ඇති අතර එක් ගිණුමක ලැබිය යුතු ශේෂයක් වශයෙනුත්, අනෙක් ගිණුමේ ගෙවිය යුතු ශේෂයක් වශයෙනුත් පෙන්නුම් කරන බැවින් එම මුදල මුළු ණය ගිණුම් ණයගැති පාලන ගිණුමේ ශේෂයට බලපෑමක් වී නොමැති අතර ඉදිරියේදී එය නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | සිදුව ඇති වරද නිවැරදි කර ණයගැති වටිනාකම නිවැරදිව දැක්විය යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) ණයගැති ගිණුමකට වැඩියෙන් සටහන් වූ රු.**2,780,184** ක ශේෂයක් ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම රු.**2,780,184** මුදල දැනට වැඩියෙන් ඇති ගිණුම් වලින් නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වැඩියෙන් සටහන් වී ඇති ණයගැති ශේෂ නිවැරදි කළ යුතු ය. |
| (ඈ) වසන්තම් එෆ් එම් ආයතනය විසින් විවිධ ක්ෂය අනුපාත භාවිත කරමින් සම්ප්‍රේෂණ උපකරණ වල ක්ෂය ගණනය කිරීම හේතුවෙන් පිරිවැය රු. **8,829,701** ක් වූ සම්ප්‍රේෂණ උපකරණ වල සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු. **534,635** කින් අඩුවෙන් දක්වා තිබුණි. | **IFRS** ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව එක් එක් වත්කමේ ආයු කාලය අනුව ක්ෂය අනුපාත වෙනස්වේ. | මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව ක්ෂය ගණනය කල යුතු ය. |
| (ඉ) නියැදි විගණන පරීක්ෂණයක් සඳහා මාධ්‍ය ජාලයේ අලෙවි අංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. **78,800,337** ක් වූ ණයගැති ශේෂය තුළ ඇතුළත් රු. **7,193,327** ක් වූ ණයගැති ශේෂය හුවමාරු ගණුදෙනු වලින් සමන්විත වූ අතර අදාල සේවා ලබාගෙන එම ගණුදෙනු අවසන් කර තිබුණද,ඒ සම්බන්ධයෙන් වූ ලේඛන හුවමාරු නොවීම හේතුවෙන් එම වටිනාකම තවදුරටත් ණයගැති වටිනාකම තුළ දක්වා තිබුණි. ඒ අනුව ණයගැතියන් නොවන රු. **7,193,321** ක වටිනාකමක් ණයගැතියන් ලෙස දක්වා තිබුණි. | ප්‍රතිවෙළඳ ගනුදෙනු අනෙකුත් වෙළඳ ආයතන සමග සිදු කරනු ලබන භාණ්ඩ හා සේවා හුවමාරුව තුලින් ඇති වන බැවින්එම වර්ෂය තුලදීම ඊට අදාළ ඉන්වොයිස්පත් හා අනෙකුත් අදාළ ලේඛන නොලැබිය හැකි අතර ඊට පසු වර්ෂ වලදී අදාළ ලේඛන සම්පූර්ණ වූ පසු නියමිත පරිදි ගිණුම් වල සටහන් කිරීමට කටයුතු කර ඇත. | හුවමාරු සේවා වලට අදාල ලේඛන නිසි පරිදි පවත්වා ඊට අදාල නිවැරදි ගිණුම් සටහන් දැක්විය යුතු ය. |
| (ඊ) **2011**වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.**1,037,763** ක් වටිනා ඉංග්‍රීසි චිත්‍රපටි **12** ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කරන ලද ගෙවීමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | මෙම මුදල චිත්‍රපට සඳහා ගෙවන අත්තිකාරම් මුදලකි. එම චිත්‍රපට මිලදී ගෙන ඇත්තේ ප්‍රයිම් ගුවන්විදුලියේ විකාශය සඳහා වන අතර එම නාලිකාව අත්හිට වූ බැවින් විකාශනය කිරීමට නොහැකි විය.එලෙසම අනෙකුත් නාලිකාවල විකාශනයට නොගැලපෙන බැවින් එම චිත්‍රපට අනෙකුත් නාලිකාවල විකාශනය කිරීමට නොහැකි විය. මෙම චිත්‍රපට විකාශන ගිවිසුම් කාලය අවසන් වී ඇත. | අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්වීමට කටයුතු කල යුතු ය. |
| (උ) වටිනාකම රු. **5,000,000** ක් වූ කෙටි කාලීන ස්ථාවර තැන්පතු ගිණුමකට අදාලව පොළී ආදායම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු පොළී ආදායම රු. **1,097,245** ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ඉල්ලුම් තැන්පතුව **2013** වර්ෂයේදී ආරම්භ කරන ලද අතර, **2020** වර්ෂයේදී පොලී මුදල් සමග ශේෂය තහවුරු කර ඇත.මෙම පොලී ආදායම **2013** වර්ෂයේ සිටම කාල පරිච්ඡේදයට අදාළ පොලිය වන අතර, එය වර්ෂයකට අදාළ පොලී ආදායම නොවේ.ඉල්ලුම් තැන්පතු පොලිය බැංකු ගිණුමට බැර නොවන අතර, ඉල්ලුම් | වර්ෂයට අදාල ආදායම හා වියදම නිවැරදිව දැක්විය යුතු ය. |

| | | |
|---|---|---|
| | තැන්පතුව මුදල් කර ගන්නා අවස්ථාවේදී පමණක් පොලී ආදායම ලැබේ.එම නිසා මෙම පොලී ආදායම ගිණුම් ගත කල නොහැකි අතර, මෙම ඉල්ලුම් තැන්පතුව ආපසු ගැනීමේදී පොලී ආදායම ගිණුම්ගත කරනු ඇත. එම නිසා මෙය නිවැරදිව සිදු කර ඇති බව දන්වමි. | |
| (ඍ) කොළඹ 07බෞද්ධාලෝක මාවතේ පිහිටි මාධ්‍ය ජාලයේ අලෙවි අංශය පවත්වාගෙන යනු ලබන ඉඩම සඳහා ගෙවිය යුතු කුලිය රු.42,300,000 ක් වුවද සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මේ සඳහා රු.40,400,000ක් වෙන්කර තිබුණි.ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 1,900,000 ක් බදු කුලී අඩුවෙන් වෙන්කර තිබුණි. | බදු කුලී ගිණුමේ ආරම්භක ශේෂය වන රු. 8,273,200 තුල මෙම බදු කුලී වියදම ඇතුලත් අතර, එම නිසා බදු කුලී වියදම නිවැරදිව ගිණුම් ගත කර ඇති බව දැක්විය හැක. | බදු කුලී වියදම නිවැරදිව ගිණුම් ගත කල යුතු ය. |

**1.5.4** නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | (රු.) | (රු). | (රු.) | | |
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව වසන්තම් ටීවී ආයතනයේ සේවාදායක ණයගැති ශේෂය | 170,113,862 | 184,581,604 | 14,467,742 | වසන්තම් ටී.වී. නාලිකාවේ ණයගැති ශේෂය වශයෙන් දක්වා ඇති රු. 170,113, 862 වටිනාකම සෘන ශේෂයන් ගැලපූ පසුව ලැබෙන ශුද්ධ ණයගැති වටිනාකම වේ.සෘන ශේෂයන් ඉවත් කල පසු සත්‍ය ණයගැති වටිනාකම රු. මිලියන 184,581,604 ක් වේ. එම නිසා රු. 14,467,742 ක ණයගැති වටිනාකම සෘන ශේෂයක් වන අතර, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ණයගැති වටිනාකම දක්වා ඇති බව පෙන්වා දිය හැක. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ තහවුරු කර ගත හැකි උපලේඛන ඉදිරිපත් කල යුතු ය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවක අර්ථසාධක අරමුදල සඳහා වියදම | 62,072,681 | 61,022,297 | 1,050,384 | සේවක අර්ථසාධක අරමුදල් ලේඛනය අනුව ලබාගත් රු. 61,022,297 වටිනාකම වැටුප් මෘදුකාංග පද්ධතියට අනුව දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද වැටුප් වලට අදාළ වටිනාකම වේ. මූල්‍ය ප්‍රකාශන අනුව සේවක | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ සනාථ කරන උපලේඛන ඉදිරිපත් කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | අර්ථසාධක අරමුදල සඳහා වියදම ලබා ගැනීමේදී ඒ සඳහා **2021** වර්ෂයේදී ගෙවනු ලබන **2020** වර්ෂයේ හිඟ වැටුප් සහ නිවාඩු දින වැටුප් වලට අදාළ සේවක අර්ථසාධක අරමුදල් ගෙවනු ලබන අතර ඒ අනුව අදාළ වර්ෂයට එම ගැලපීම සිදු කරනු ලබයි.<br>එම නිසා සේවක අර්ථසාධක අරමුදල් සඳහා වියදමත් සේවක අර්ථසාධක අරමුදල් දායක ලේඛනය අනුව වටිනාකමත් වෙනසක් විය හැක.නිවැරදිව ගැලපීම සිදු කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදල් වියදම මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති බව පෙන්වා දිය හැක. | |
| (ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් වටිනාකම | **8,732,149** | විගණන ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. **7,797,848** | **934,301** | **2020** වර්ෂයට අදාලව හිඟ වැටුප් සහ නිවාඩු දින වැටුප් සඳහා සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම සිදුකරනු ලබන බැවින් ඒ අනුව ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ගණනය කිරීම නිවැරදිව සිදු කර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ සනාථ කරන උපලේඛන ඉදිරිපත් කල යුතු ය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා වියදම | **12,343,561** | **12,204,460** | **139,101** | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ලේඛනය අනුව ලබා ගත් රු. **12,204,460** වටිනාකම වැටුප් මෘදුකාංග පද්ධතියට අනුව දෙසැම්බර් **31** දක්වා ගෙවන ලද වැටුප් වලට අදාළ වටිනාකම වේ. මූල්‍ය ප්‍රකාශන අනුව සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා වියදම ලබා ගැනීමේදී ඒ සඳහා **2021** වර්ෂයේදී ගෙවනු ලබන **2020** වර්ෂයේ හිඟ වැටුප සහ නිවාඩු දින වැටුප් වලට අදාළ සේවානියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවනු ලබන අතර ඒ අනුව අදාළ වර්ෂයට එම ගැලපීම සිදු කරනු ලබයි.එම | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ සනාථ කරන උප ලේඛන ඉදිරිපත් කළ යුතු ය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | නිසා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් සඳහා වියදමින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් දායක ලේඛනය අනුව වටිනාකමින් වෙනස් විය හැක. | |
| (ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් වටිනාකම | **1,056,896** | විගණන ගණනය කිරීම් අනුව එම වටිනාකම රු. **947,134** | **109,762** | **2020** වර්ෂයට අදාලව හිඟ වැටුප් සහ නිවාඩු දින වැටුප් සඳහා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගෙවීම් සිදු කරනු ලබන බැවින් ඒ අනුව ගෙවිය යුතු සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ගණනය කිරීම නිවැරදිව සිදු කර ඇති බව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ශේෂ සනාථ කරන උපලේඛන ඉදිරිපත් කල යුතු ය. |

### 1.5.5 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලයේ ස්කන්ධ ප්‍රාග්ධනය **2015** වර්ෂයේ රු.**3,198,499,721** ක් වූ අතර **2020** වර්ෂය දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. **2016** වර්ෂයේ සිට **2020** වර්ෂය දක්වාරු. **107,189,266** ක් සිට රු**226,860,960** ක් දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේ ස්වාධීන රූපවාහිනී සේවයේ අලාභයරු.**210,623,700** ක් වූ අතර ඒ යටතේ පවතින, අයිටීඑන් එෆ්එම්,වසන්තම් එෆ් එම් හි අලාභයන් පිළිවෙලින් රු.**52,557,304** ක්, සහ රු.**13,177,729** ක් වූ අතර වසන්තම් ටීවී ආයතනයේ ලාභය රු. **62,384,227** ක් විය. ඒඅනුව **2020** වර්ෂයේ සමාගමේ මුළු අලාභය රු.**213,974,507** ක් වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | අලාභ තත්වය මග හරවා ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. |

### 1.5.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) රු. **226,926,032** ක් වූ වසර දෙකකට වැඩි ණයගැති ශේෂ කාල විශ්ලේෂණය සම්බන්ධව විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. | රු. **226,926,032** | ශේෂය කොපමණ කාලයක සිට පැවත එන්නේද යන්න හදුනාගැනීමට අදාලව විස්තරාත්මක තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වසර දෙකකට වැඩියෙන් හිඟ ශේෂයන් **2001** වසරේ සිට පවතින ශේෂයන්ය. **2001** වසරේ සිට **2018** අවසානය දක්වා වසර **17**ක් තුල පවතින ශේෂයන් බව කාරුණිකව දන්වා සිටිමි. | ණයගැති ශේෂයන්ගේ කාල විශ්ලේෂණ යක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතු ය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මාධ්‍ය ජාලය විසින් අලෙවිකරණ ලද ගුවන් කාලය සඳහා අයවිය යුතු රු.9,869,852 ක් වෙනුවෙන් සේවාදායක ණයගැතියන්ට එරෙහිව නඩු 07 ක් පවරා තිබුණු අතර එයින් රු. 6,652,442 ක් වටිනා නඩු 04 ක් සඳහා සිතාසි භාර දීමට නොහැකිවීමෙන් නඩු කටයුතු නවතා තිබුණි. විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මූල්‍ය වර්ෂය අවසන් දිනට වසර 02 ක් ඉක්මවා ඇති ණයගැති ශේෂය රු. 266,926,032 ක් වුව ද ඉන් සියයට 4 ක වටිනාකමක් අයකර ගැනීම සඳහා පමණක් නඩු පවරා තිබුණි. | නඩු කටයුතු සඳහා ඉදිරිපත්කරන්නේ වෙනත් මාර්ගයකින් අයකරගැනීමට අපහසු ගනුදෙනුකරුවන් හා අප සමග දීර්ඝ කාලයක් ගනුදෙනු කරන ඒජන්සි ලැබෙන දැන්වීම් වලට අදාලව සමහර අවස්ථාවල හිඟ තිබෙන මුදල් වලට නොවේ. එම ඒජන්සිය සමග සාකච්ඡා කර මුදල් ලබාගැනීමට කටයුතු කරන අතර මෙසේ ලැබිය යුතු මුදල් විකාශයේදී සිදු වූ ගැටළු සහගත බව නිසා ඉතිරිවූ මුදල් වේ.අප ආයතන විසින් ලබා දෙන ණය වලින් 98% පමණ අයකර ගැනීමට කටයුතු කරන අතර ඉතිරි ඒවා නීති මගින් අයකර ගැනීමට හැකි ඒවා නීති අංශයට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. තවද 2001 වසරේ සිට පවතින ශේෂයන් වන අතර මුළු ණයට විකුණුම් මත එම ප්‍රමාණය 1% - 2% අතර පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | සේවාදායක ණයගැති අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවාදායක ප්‍රතිවෙළඳ ණයගැති ශේෂය රු. 26,102,280 ක් වූ අතර මාධ්‍ය ජාලය විසින් අදාළ සේවාවන් සපයා නොගැනීම හේතුවෙන් වසර 05 ක් ඉක්මවා ඇති ප්‍රතිවෙළඳ ණයගැති ශේෂයන්ගේ එකතුව රු. 14,641,728 ක් සඳහා මූල්‍ය වර්ෂයේ හානිකරණ ගැලපීම සිදුකර තිබුණි. | ප්‍රති වෙළඳ ගනුදෙනු සම්බන්ධව අදාළ ඉන්වොයිස් පත් හා ලිපි ලේඛන නිසියාකාරව නොතිබු බැවින් මෙම වටිනාකම් ගිණුම් වලට ගැනීමට හා අනෙකුත් ඉදිරි කටයුතු කිරීමට ගැටලුකාරී තත්වයක් පවතී. | ප්‍රතිවෙළඳ ගණුදෙනු සම්බන්ධයෙන් නිසියාකාරව ලේඛන පවත්වා ගැනීම හා අදාල සේවාව ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු ය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. 63,929,480ක් වූ විලම්බිත ආදායම් ශේෂය තුළ වසර 05 ට අඩු ශේෂය රු.18,866,794 ක් ද, වසර 05 ත් 10 ත් අතර ශේෂය රු. 16,108,606 ක් ද, වසර 10 ට වැඩි ශේෂය රු. 28,954,081 ක් ද ඇතුළත්ව තිබුණු අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත මෙම වර්ෂයේ ගිණුම් වලට ගැනීමට කටයුතු කරනු ඇත.මේ නිසා මෙම වටිනාකමින් අලාභ තත්වය අඩුවීමට හෝ ලාභය වැඩිවීමට බලපානු ඇත. | විලම්භිත ආදායම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | |
|---|---|---|
| (ආ) **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන රු. **137,772,746** ක් වූ සේවාදායක අත්තිකාරම් ශේෂය තුළ ඇතුළත් වසර **10** ක් ඉක්මවූ ශේෂය රු. **33,620,223** ක් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | මෙම ගෙවිය යුතු වටිනාකම සම්බන්ධයෙන් තොරතුරු ලබාගෙන එම ගෙවීම් සම්බන්ධව නිවැරදි තහවුරුවක් ලබා මෙම වර්ෂයේදී ගිණුම් වලට ගැනීමට කටයුතු කරනු ඇත. | සේවාදායක අත්තිකාරම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.**11,898,232** ක් වූ අවලංගු කළ චෙක්පත් ගිණුමේ ශේෂය තුළ වසර **05** කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද චෙක්පත් **554** ක වටිනාකම රු.**4,541,250** ක් සහ වසර **02** ත් **05** ත් අතර චෙක්පත් **570** ක වටිනාකම රු.**6,602,258** ක් ඇතුළත් වූ අතර මෙම ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | ගනුදෙනුකරුවන් වෙත නිකුත් කල නමුත් ඔවුන් විසින් චෙක්පත් රැගෙන නොයාම හේතුවෙන් හා රැගෙන ගිය නමුත් විවිධ හේතු මත බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත්වලින් මෙම වටිනාකම සමන්විත වේ.වසර **5** කට වඩා වැඩි කාලයක් සහිත අවලංගු කල චෙක්පත් වටිනාකම ආදායමට ගැනීම සඳහා විගණන හා කලමනාකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කර නිර්දේශ ලැබීමෙන් පසු **2021** වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කරනු ඇත. | අවලංගු කල චෙක්පත් ගිණුමේ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඈ) වෙනත් ගෙවිය යුතු ශේෂයන් යටතේ දැක්වෙන රු. **2,268,386** ක් වූ හිමිකම් නොපෑ ගෙවීම් වලින් වර්ෂ **3** කට වඩා පැරණි, හිමිකම් නොපෑ ශේෂය රු.**1,208,728** ක හිමිකම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් පසුව මෙම මුදල් ආපසු ගෙවීමට හෝ විධිමත් ගිණුම්කරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ හේතුන් මත මෙම මුදල් ගෙවා නොමැති අතර ඒසම්බන්ධව තොරතුරු ලබා විගණන හා කලමනාකරණ කමිටුවේ නිර්දේශය මත ගිණුම්වලට ගැනීමට කටයුතු කරනු ඇත. | හිමිකම් නොපෑ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඉ) **2020** දෙසැම්බර් **31** දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු. **54,208,495** ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ **2012** වසරේ සිට පැවත එන එකතුව රු. **50,628,651** ක් වූ ශේෂය හඳුනා ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | විවිධ හේතුන් මත මෙම මුදල් ගෙවා නොමැති අතර, විගණන හා කලමනාකරණ කමිටුවේ නිර්දේශය මත ගිණුම්වලට ගැනීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ඊ)සමාලෝචිත වර්ෂය අවසන් දිනට වටිනාකම රු. **1,687,956** ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂය තුළ ඇතුලත් වසර **03** ක් ඉක්මවා ඇති එකතුව රු. **855,707** ක් වූ ගෙවියයුතු තැන්පතු **112** ක් තැන්පතුකරුවන්ට ආපසු ගෙවීමට හෝ විධිමත් ගිණුම්කරණ ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් අංශයට ක්‍රියාමාර්ගයක් ගත නොහැකි අතර අනෙකුත් අංශ මඟින් සේවා ලබාගැනීම සිදුකරයි. එම නිසා එම අංශවලින් ලැබෙන නිර්දේශ මත මෙම තැන්පතු මුදල් ගෙවීම සිදුකරනු ලබන අතර ඉතිරි මුදල ගිණුම් වල පෙන්නුම් කරයි. | ආපසු ගෙවිය යුතු තැන්පතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

| | | | |
|---|---|---|---|
| (උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හදුනා නොගත් ණයහිමි ශේෂය රු. 1,253,409 ක් වූ අතර නිවැරදි සේවාදායකයා හදුනාගෙන නිරවුල් කිරීමකින් තොරව හදුනානොගත් ණයහිමි ගිණුමේ ඇතුලත් කර තිබුණි. | ඇතැම් අවස්ථාවලදී ප්‍රධාන සේවාදායකයන් නොවන සමහර සේවාදායකයන් සෘජුව බැංකුව වෙත මුදල් තැන්පත් කරන අතර එම තැන්පතු විස්තර අප වෙත ලබා නොදීම හේතුවෙන් සේවාදායකයා සොයා ගැනීමට නොහැකි අවස්ථා ඇත. අලෙවි විධායකවරු හරහා එම සේවාදායකයන් සොයා ගනිමින් එම ගැටලුව නිරාකරණය කරමින් පවතී. | ණයහිමි ශේෂ හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු ය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛය | | | |
| (i) 02 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනි ලෙස 2020 වර්ෂය තුල දී මාධ්‍ය ජාලයේ සභාපති වරයාගේ රාජකාරි හෝ පුද්ගලික පාවිච්චිය සඳහා වෙන්කරන ලද නිල වාහනයට අමතරව කුලී වාහනයක් යොදවා තිබුණි.මෙම වාහනය කුලියට ලබා ගැනීම වෙනුවෙන් 2020 ඔක්තෝබර් 29 දින සිට 2021 ඔක්තෝබර් 29 දක්වා වර්ෂයක කාලයක් සඳහා බාහිර පාර්ශවයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබීමට පෙර සිට වාහනය භාවිතයට ගෙන තිබුණි.ඒ අනුව 2020 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය වෙනුවෙන් ඉන්ධන වියදම රු. 291,249 ක් හා කුලිය රු.1,143,742 ක් වශයෙන් එකතුව රු 1,434,991 වැය කර තිබුණි. | ස්වාධීන රූපවාහිනී සේවයට අයිති අයිටීඑන්, ලක්හඬ, වසන්තම් එෆ් එම් සහ වසන්තම් ටීවී යන සේවා පවත්වාගෙන යන මාධ්‍ය ජාලයකි. ඒ අනුව සභාපතිවරයාට ආයතනයේ විවිධ වැඩසටහන් සහ උත්සව වෙනුවෙන් දිවයිනේ විවිධ ප්‍රදේශ වලට ගමන් කිරීමට සිදුවේ.එයට අමතරව නිතරම අප අමාත්‍යාංශයට, අගමැති කාර්යාලයට,ජනාධිපති කාර්යාලයට වැනි රාජ්‍ය ආයතන වලට යාමට සිදුවේ. එම නිසා මාසිකව වැඩි කිලෝ මීටර් ප්‍රමාණයක් ධාවනය කිරීමට සිදුවේ. නමුත් සභාපතිතුමාගේ KV 6110 නිල රථය පැරණි නිතර කාර්මික දෝෂ ඇතිවන රථයක් බැවින් සේවා අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති මත සභාපතිතුමාට සුදුසු ජීප් රථයක් ලබාගෙන ඇත.ඒ අනුව ඉන්ධන සහ කුලිය වශයෙන් අදාළ මුදල් වියදම් වී ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii) 02** ඡේදය හා **3.1** ඡේදය | නිලවාහන සඳහා හිමිකම් නොමැති හා අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවන තනතුරකට විධිමත් නොවන ආකාරයෙන් බඳවාගන්නා ලද නිලධාරියෙකු වෙත ආයතනික වාහනයක් රියදුරු රහිතව ලබා දී තිබුණි. තව ද මසකට පෙට්‍රල් ලීටර් **140** ක ඉන්ධන දීමනාවක් මෙම නිලධාරියාට ලබා දී තිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ දැනුම්දීම මත මාධ්‍ය අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වන "ඇසිදිසිපෙරමග - සෞභාග්‍යයේ පුනරුදය" වැඩසටහන සඳහා ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සම්බන්ධීකරණ නිලධාරියෙකු වශයෙන් කටයුතු කිරීම සඳහා මෙම නිලධාරියා පත්කර ඇත. එම රාජකාරී ඉටු කිරීම සඳහා මෙම නිල රථය සහ ඉන්ධන දීමනාව ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. . |
| **(iii) 3.1** ඡේදය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව ප්‍රවාහන හා ඉන්ධන දීමනාව සඳහා හිමිකම් නොමැති නිලධාරින් **337** දෙනෙකුට ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා වශයෙන් රු.**21,639,349** ක් **2020** වර්ෂය තුළ දී ගෙවා තිබුණි. | ස්වාධීන රූපවාහිනී සේවය රූපවාහිනී නාලිකා දෙකක් සහ ගුවන්විදුලි නාලිකා දෙකකින් සමන්විත රාජ්‍ය මාධ්‍ය නාලිකාවක් ලෙස වසරකට දින **365** පැය **24** මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. මෙම අඛණ්ඩ සේවාව ඵලදායී ලෙස කාර්යක්ෂමව පවත්වා ගැනීමට සේවක අභිප්‍රේරණය වර්ධනය කිරීම සඳහා මෙම දීමනා ආයතනයේ සාංගමික ව්‍යවස්ථාවට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත ගෙවීම් සිදු කරනු ලැබේ. මෙම ක්‍රමවේදයන් තුලින් සේවක සුබ සාධනය හා අභිප්‍රේරණය කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| | **(ii)** මාධ්‍ය ජාලයේ සභාපති තනතුර සඳහා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා හිමිකම ඇති ඉන්ධන ප්‍රමාණය මාසිකව ලීටර් **170** බැගින් වුවත් මාධ්‍ය ජාලය විසින් සපයන ලද වාහනය සඳහා අනුමත ඉන්ධන ප්‍රමාණයට වඩා වැඩියෙන් රු. **1,070,811** ක් වටිනා ලීටර් **6,651** ක් සපයා තිබුණි. මූල්‍ය වර්ෂය තුළදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රවෘත්ති) විසින්රු. **241,955** ක් වටිනා ඉන්ධන ලීටර් **1,833** ක් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා **334/33** අනුව සභාපතිවරයා හට මසකට ඉන්ධන ලීටර **700** දක්වා අනුමැතිය ලබාගෙන ඇති අතර, එයට අමතරව එම මාස වල සත්‍ය ඉන්ධන පාවිච්චිය වෙනුවෙන් ජන මාධ්‍ය ලේකම්තුමාගේ අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරඇත. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන්ගේ වැඩිපුර ඉන්ධන වැයවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. ඉහත ඉන්ධන භාවිතා කිරීම පැය **24** ම ක්‍රියාත්මක | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (අලෙවි) විසින් රු. **125,928** ක් වටිනා ඉන්ධන ලීටර් **954** ක් ද අනුමත ඉන්ධන ලීටර් ප්‍රමාණයට වඩා වැඩියෙන් ලබාගෙන තිබුණි. | වන මාධ්‍ය නාලිකා **04** ක් කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා දරණ ඉන්ධන වියදම වේ. | |
| **(iv) 3.3** ඡේදය | මාධ්‍ය ජාලයේ ප්‍රවාහන දීමනා ලබාගන්නා **HM 1-2** වැටුප් කාණ්ඩයේ නියෝජ්‍ය සමානාධිකාරිවරුන් හට ආයතනයේ ප්‍රවාහන පහසුකම් සැපයිම සඳහා චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව , **2020** ජුනි **26** දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ **337/13** මගින් අනුමැතිය ලබා දී තිබුණි. | මෙය ආයතනයේ සේවා අවශ්‍යතාවය මත සේවාවන් පවත්වාගෙනයාමට අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණයක් අනුව ක්‍රියාත්මක කරන ගෙවීමකි | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) **2020** දෙසැම්බර් **18** දිනැති අංක පීඊඩී **03/2020** චක්‍රලේඛය | **2019** මුල්‍ය වර්ෂයේ දී අලාභ තත්වයක් වාර්තා කර ඇති,එහෙත් **2018** මුල්‍ය වර්ෂයට සාපේක්ෂව එම අලාභදායී බව අඩු කරගෙන ඇති රජය සතු සමාගම් එක් අයෙකුට රු. **5,000** ක් පමණක් ප්‍රසාද දීමනා ගෙවිය හැකි වුවත් එයට පටහැනිව මාධ්‍ය ජාලය විසින් එක් අයෙකුට රු.**13,000** බැගින් **2020** දෙසැම්බර් මාසයේ දී සේවකයන් **696** ක් සඳහා රු.**9,046,000** ක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | ආයතනය සේවකයන් අභිප්‍රේරණය කිරීම සඳහා කාර්ය සාධන දීමනාවක් කාර්ය මණ්ඩලයෙහි කාර්ය සාධනය ඇගයීමට යටත්ව ක්‍රමවේදයකට ගෙවීම් කරනු ලැබේ. ආයතනයේ සාංගමික ව්‍යවස්ථාව අනුව කාර්ය මණ්ඩල දීමනා අධ්‍යක්ෂකමණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ගෙවා ඇත. මෙම ගෙවීම් සිදු කරනු ලබන්නේ පෙර වර්ෂයේ ලාභයේ ප්‍රතිශතයෙනි.සේවක සුභ සාධනය වර්ධනය කිරීම වෙනුවෙන් මෙම ගෙවීම් සිදු කරනු ලබයි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) **2013** ජනවාරි **31** දිනැති අංක **02/2013** රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| **(i)** හැඳින්වීමේ ඡේදය | චක්‍රලේඛ විධිවිධාන අනුව ලබාගත හැකි වන්නේ බැංකු පෙරගෙවුම් කාඩ්පතක් වුවද මාධ්‍ය ජාලය විසින් ලංකා බැංකු ණය කාඩ්පතක් ලබාගෙන තිබුණි. | පෙර ගෙවුම් කාඩ්පත් මඟින් මෙම ගෙවීම් සිදු කල නොහැකි බැවින් අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියට යටත්ව බැංකු ණය කාඩ්පතක් ආයතනයේ අවශ්‍යතාවය මත ලබා ගන්නා ලදී. (අධ්‍යක්ෂ මණ්ඩල අනුමැති අංක **324/12**) ණය කාඩ් භාවිතය සඳහා | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අමාත්‍යාංශය මඟින් මහා භාණ්ඩාගාරය අවශ්‍ය අනුමැතියට ඉදිරිපත් කර ඇති බව දන්වමි. | |
| **(ii) 03** ඡේදය | ලබාගත හැකි බැංකු පෙර ගෙවුම් කාඩ්පතෙහි උපරිම සීමාව රු. **100,000** ක් වුවද මාධ්‍ය ජාලය විසින් ලබාගෙන ඇති ණය කාඩ්පතෙහි උපරිම සීමාව රු. **900,000** ක් විය. | මෙය පෙර ගෙවුම් කාඩ්පතක් නොව බැංකු ණය කාඩ්පතක් බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව ආයතනයේ වියදම් වල ස්වභාවය අනුව ණය කාඩ්පතෙහි උපරිම සීමාව නියම කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| **(iii)05 (iii)**ඡේදය | බැංකු පෙර ගෙවුම් කාඩ්පතකින් ගෙවීම් සිදුකරන අවස්ථාවේදීම කාඩ්පත භාර නිලධාරියා සෘජු අධීක්ෂණය කරන නිලධාරියාගේ දූරකථනයට ගෙවීම් තහවුරු කිරීමේ කෙටි පණිවිඩයක් ලබාගැනීමට අවශ්‍ය පහසුකම් බැංකුවෙන් ලබාගත යුතු වුවද මාධ්‍ය ජාලය විසින් ලබාගෙන තිබුණු ණය කාඩ්පතෙන් සිදු කරන ගෙවීම් තහවුරු කිරීම සම්බන්ධයෙන් එවැනි පහසුකමක් සලසා ගෙන නොතිබුණි. | ණය කාඩ්පතට ගෙවීම්කිරීමේදී අදාළ පණිවිඩය ලබාදෙනු ලබන්නේ අදාළ කාඩ්පත නිකුත් කල නිලධාරියාට බව බැංකුව විසින් දැනුම්දෙනලදී. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| **(iv) 06** ඡේදය | පෙර ගෙවුම් කාඩ්පත මගින් කරනු ලබන ගෙවීම් සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ගිණුම්කරණ පියවරයන් දක්වා තිබුණද මෙම කාඩ්පත සම්බන්ධයෙන් ගිණුම්වල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | පෙර ගෙවුම් කාඩ්පත සඳහා ක්‍රමවේදය මේ සඳහා යොදා ගත නොහැකි අතර, මෙම ණය කාඩ්පතින් සෑම වියදමක්ම අභ්‍යන්තර විගණන අංශය වෙත විගණනය සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි. අදාළ වියදම් ගිණුම් වලට හර කිරීම වියදම ප්‍රතිපූරණය කිරීමේදී සිදු කරනු ලබයි. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

## **1.8** මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පසුගිය වර්ෂ **04** ක කාලපරිච්ඡේදය තුළ මාධ්‍ය ජාලය විසින් රු. **25,000,000** ක ස්ථාවර තැන්පතු ආයෝජනයක් පමණක් සිදු කර තිබුණු අතර එම කාලපරිච්ඡේදය තුළ එකතුව රු.**1,428,973,398** ක් වටිනා ස්ථාවර තැන්පතු මුදල් කරගෙන තිබුණි. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා | අදහස් දක්වා නොමැත | ආයතනයේ මූල්‍ය තත්වය වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

අරමුදල් ආයෝජනය කිරීම මෙන්ම අරමුදල් ගලා එන මාර්ග වර්ධනය කර ගැනීමට කටයුතු කිරීම මුල්‍ය කළමනාකරණයේ වගකීමක් වුවත් මාධ්‍ය ජාලය විසින් සිය දෛනික කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා මාධ්‍ය ජාලයේ ප්‍රධාන මුදල් ගලා එන මාර්ගය වන සේවාදායක ණයගැති ශේෂ අයකරගැනීමට ප්‍රායෝගික ,විධිමත් හා කර්යක්ෂම වැඩපිළිවෙළක් අනුගමනය කර නොතිබුණි.

| | | |
|---|---|---|
| (ආ) මාධ්‍ය ජාලය විසින් **2013 – 2017** වර්ෂ අතර කාලය තුළ තැන්පත් කරන ලද කෙටිකාලීන හා දිගුකාලීන ස්ථාවර තැන්පතු පිළිවෙලින් රු. **326,513,275** ක් හා රු. **604,748,994** ක් **2018** හා **2019** වර්ෂ තුළදී මුදල් කරගෙන තිබුණි. ඒ අනුව **2018, 2019** වර්ෂ වලදී ස්ථාවර තැන්පත් පහල යාමේ ප්‍රතිශතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින් සියයට **14** ක් හා සියයට **39** ක්වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව පොලී ආදායම පිළිවෙලින් සියයට **15** කින් හා සියයට **31** කින් පහල ගොස් තිබුණි. | අදහස් දක්වා නොමැත | ආයතනයේ මුල්‍ය තත්වය වර්ධනය කර ගැනීම සඳහා කටයුතු කල යුතුය. |

**2.** මුල්‍ය සමාලෝචනය

---

**2.1** මුල්‍ය ප්‍රතිඵල

---

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. **213,974,507** අලාභය වූ අතර ඉකුත් වර්ෂයේ රු. **571, 884,034** ක් විය. ඒ අනුව මුල්‍ය ප්‍රතිඵලයෙහි රු. **357,909,528** ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට **2020** මුල්‍ය වර්ෂයේ පුනරාවර්ථන වියදම් වෙනුවෙන් ලැබුණු රු. **280,000,000** ක් වටිනා රාජ්‍ය ප්‍රදානය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන් වල ප්‍රවණතා විශ්ලේෂණය

---

සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ආදායම් රු.**345,490,014** හා පෙර වර්ෂයේ අනෙකුත් ආදායම් රු.**55,171,578** හා සැසඳීමේ දී පෙර වර්ෂයට සාපේක්ෂව අනෙකුත් ආදායම් **526%** ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණු අතර ඊට ප්‍රධාන වශයෙන් පුනරාවර්තන වියදම් වෙනුවෙන් ලද රු.**280,000,000** ක් වටිනා රාජ්‍ය ප්‍රදානය හේතු වී තිබුණි.සමාලෝචිත වර්ෂයේ ශුද්ධ අලාභය වූ රු. **213,974,507** හා පෙර වර්ෂයේ ශුද්ධ අලාභය රු. **571,884,034** ක් වූ බැවින් ශුද්ධ අලාභය රු. **357,909,527** කින් අඩු වී තිබුණු අතර පෙර වර්ෂයට සාපේක්ෂව **63%** ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි. වැඩසටහන් වියදම් හා අලෙවි වියදම් ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් **20%** හා **22%** කින් අඩු වී තිබුණි.මුල්‍ය වර්ෂයේ බදු වියදම **40%** ක ප්‍රතිශතයකින් වැඩි වී තිබුණු අතර ශුද්ධ මුල්‍ය ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව **49%** ක ප්‍රතිශතයකින් අඩු වී තිබුණි.ඊට ප්‍රධාන වශයෙන් ස්ථාවර තැන්පතු මුදල් කර ගැනීම තුලින් ඇති වූ ආයෝජන ආදායම අඩු වීම හේතු වී තිබුණි.

**2.3** අනුපාත විශ්ලේෂණය

| | **2020** | **2019** |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය (වාර) | 1.7 | 2 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර) | 1.6 | 1.98 |
| දළ ලාභ අනුපාතය | 94% | 60% |

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** හඳුනා ගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලයේ හිටපු සේවකයෙකු විසින් 2011 වර්ෂයේදී වංචා කරන ලද මුදලකින් තවදුරටත් ලැබිය යුතු රු.1,210,620 ක් අයකර ගැනීමට කටයුතු කිරීමකින් තොරව සම්පූර්ණ වටිනාකම සඳහා හානිකරණ ගැලපීම් සිදුකර තිබුණි. | ආයතනයේ හිටපු සේවකයෙකුද වංචා කළ මුළු වටිනාකම රු.2,009,620/- විය. එම වටිනාකම අයකර ගැනීමට 2007 වර්ෂයේ අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. ඒ අනුව ඔහු වසර 3ක් සිරගතව සිට දඩුවමට ලක්වී ඇත.එමෙන්ම මුළු මුදලින් රු.799,000 ක මුදලක් ගෙවා ඇත. ඉතිරි රු.1,210,620 අයකර ගැනීමට ඇත. එම මුදල අයකර ගැනීමට අධිකරණ නියෝග ලැබී ඇතත් ඔහුට කිසිදු දේපලක් නොමැති නිසා අයකර ගැනීමට නොහැකි වී ඇත. එම නිසා මුළු මුදල සඳහා හානිකරණ ගැලපීම් සිදුකරන ලදී. | අයකර ගැනීම් අප්‍රමාදව සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ටෙලි නාට්‍ය විකාශය සඳහා තෝරාගැනීම පූර්ව දර්ශන මණ්ඩලයක නිර්දේශ මත සිදුකරනු ලැබුව ද එම මණ්ඩලය විසින් නිර්දේශ කරනු ලබන කාලයන් තුල අදාල නාට්‍ය විකාශය නොකල අවස්ථා මෙන්ම ඇතැම් නාට්‍ය සඳහා පූර්ව දර්ශන මණ්ඩලය විසින් විකාශය සඳහා සුදුසු කාලය නිර්දේශ නොකල අවස්ථාද විය. මිලදී ගන්නාලද නාට්‍ය සුදුසු ගුවන්කාලය තුල විකාශය නොකිරීම හේතුවෙන් ඒ තුළින් ලාභ ඉපයීමට තිබු අවස්ථා මගහැරී තිබුණි. | ටෙලිනාට්‍ය පූර්ව දර්ශන කමිටුව හුදෙක් ස්වාධීන කමිටුවක් වන අතර ඔවුන් නාට්‍ය පිළිබඳව ස්වාධීන මතයක් පමණක් ලබා දේ. නමුත් මිලදී ගතයුතු නාට්‍ය හා ගුවන් කාලය තීරණය කිරීමේ අධිකාරිය ඇත්තේ කළමනාකාරිත්වය නියෝජනය කරන වැඩසටහන් මිලදීගැනීමේ කමිටුවට බව පෙන්වා දෙමු. අලාභ ලබා ඇත්තේ දැනට පවතින පුද්ගලික නාලිකා වල තරඟකාරිත්වය නිසා හා 2020 වර්ෂයේ රටේ පැවති Covid-19 තත්ත්වය මත බව සඳහන් කරමු. | අලාභ මගහරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) විකාශය සඳහා ටෙලිනාට්‍ය තෝරාගැනීමේ දී පූර්ව දර්ශන මණ්ඩලය විසින් සී වර්ගීකරණය යටතේ ටෙලි නාට්‍ය වර්ගීකරණය කර තිබුණද ඒ සඳහා අනුමත ගෙවීම් ටෙලි නාට්‍ය මිලදී ගැනීමේ ක්‍රමවේදයට ඇතුළත් කර නොතිබුණි. 2020 වර්ෂයේ විකාශය කල නාට්‍ය 25 ක් අතුරින් නාට්‍ය 07 ක කථාංග 378 ක් සී වර්ගීකරණය යටතේ මිලදී ගෙන තිබුණු අතර ඒ සඳහා විවිධ රේටයන් යටතේ රු. 76,500,000 ක් ගෙවීම් සිදුකර තිබුණි. | ටෙලි නාට්‍ය කථාංගයක මිල තීරණය කිරීමේ බලය ලබාදී ඇත්තේ වැඩසටහන් මිලදීගැනීමේ කමිටුවට බව සඳහන් කරමි. අධ්‍යක්ෂක මණ්ඩල වාර්තා අංක 331/15 (2019/11/05) මගින් කමිටුවට බලය ලබාදී ඇත. ටෙලි නාට්‍යයක මිල තීරණය කිරීමේදී වැඩසටහන් මිලදී ගැනීමේ කමිටුව විසින් එම නාට්‍යයේ නිෂ්පාදන වියදම, ගුණාත්මකභාවය, එය විකාශනය කිරීමෙන් ලබා ගත හැකි ආදායම ආදිය සලකා ටෙලිනාට්‍යක මිල තීරණය කරනු ලැබේ. | ටෙලිනාට්‍ය මිලදී ගැනීමේ ක්‍රමවේදය විධිමත් කර ඒ අනුව මිලදී ගැනීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාධ්‍ය ජාලයට එරෙහිව අපහාස වන්දි නඩු 03 ක් පවරා තිබුණු අතර ඒ සඳහා ඉල්ලුම් කරන ලද වන්දි මුදල රු. 105,000,000 ක් විය. ශ්‍රී ලංකාව තුළ මාධ්‍ය මගින් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම ,බෙදා හැරීම හෝ විකිනීමට ඇති අයිතිවාසිකම සමාගම විසින් කඩ කිරීමට එරෙහිව නඩු 06 ක් සහ සමාගමට එරෙහිව චිත්‍රපට බුද්ධිමය දේපල නඩු 06 ක් පවරා තිබුණු අතර එම නඩු සඳහා ඉල්ලා ඇති වන්දි මුදල රු. 510,325,000 ක් විය. සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ අනිවාර්ය විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නඩු 08 ක් සහ වෙනත් කරුණු සඳහා නඩු 03 ක් ද සමාගමට එරෙහිව පවරා තිබුණි. මෙම නඩු කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 3,321,250 ක වියදමක් දරා තිබුණි. | මෙහි සඳහන් කරුණු සහ වටිනාකම් නිවැරදි බවට නීති නිලධාරිනිය විසින් සහතික කර ඇත. | මාධ්‍ය ජාලයට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කළ යුතුය. |

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී අයිටීඑන් නාලිකාව විසින් ටෙලිනාට්‍ය 20 ක් මිලදීගෙන තිබුණු අතර ඉන් ටෙලිනාට්‍ය 13 කින් රු. 60,965,986 ක අලාභයක් ලබා තිබුණි. තවද ටෙලිනාට්‍ය මිලදී ගැනිමේදී, කථාංගයක් සඳහා ගෙවිය යුතු අනුමත රේටය ඉක්මවා ගෙවීම් සිදුකර තිබුණු අතර 2020 වර්ෂය තුලදී නාට්‍ය 06 ක් සඳහා එසේ වැඩිපුර ගෙවන ලද වටිනාකම රු. 15,565,000 ක් වී තිබුණි. | ආයතනයේ සමස්ථ අදායම ඇස්තමේන්තු කිරීමේදී ටෙලිනාට්‍ය වලින්, පුවත් විකාශයෙන්,චිත්‍රපටවලින් සහ අනෙකුත් වැඩසටහන් යනාදී වශයෙන් ප්‍රතිශතයක් ලෙස ඇස්තමේන්තු කෙරේ. ඉන් ටෙලිනාට්‍ය සඳහා සීමිත ගුවන් කාලයක් වෙන්කර ඇති බැවින් මුළු අදායමෙන් ටෙලිනාට්‍ය අදායම ඉතා අඩු ප්‍රතිශතයක් වේ. අනෙකුත් තරඟකාරී පුද්ගලික නාලිකා මෙන් සංස්කෘතිය, සදාචාරය පසෙකලා ගුණාත්මකභාවයෙන් තොර ටෙලිනාට්‍ය විකාශය කර අදායම් ලැබීමේ හැකියාවක් රාජ්‍ය ආයතනයකට නොමැත. පවතින තරඟකාරීත්වය මත සෑම නාට්‍යයකින්ම ලාභ ලැබිය නොහැක.<br>ටෙලිනාට්‍ය මිල නියම කිරීම සඳහා කලින් අනුමත රේටයක් නොමැත. එක් එක් නාට්‍ය සඳහා වැඩසටහන් මිලදීගැනීමේ කමිටුව අනුමත රේටයන්ට අනුව මිල තීරණය වේ. මෙම නාට්‍ය 06 සඳහා ද අදාල කමිටුවේ අනුමත මුදලට ගෙවා ඇත. එමනිසා එසේ වැඩිපුර ගෙවීමක් නැත. | ටෙලිනාට්‍ය මිලදී ගැනීම විධිමත් හා විනිවිද භාවයෙන් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) මාධ්‍ය ජාලය විසින් විදුලි බිල්පත් නියමිත කාලය තුළ ගෙවීම කෙරෙහි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ප්‍රමාද දඩ මුදල් වශයෙන් රු. 348,279 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි | මෙම දඩ මුදලට අදාළ විශ්ලේෂණය පහත පරිදි වේ.<br><br>යටියන්තොට රු. 230,797<br>නායබැද්ද රු. 6,592<br>හුන්නස්ගිරිය රු. 4,041<br>වික්‍රමසිංහපුර රු. 106,849<br>රු. 348,279<br><br>මෙම හිඟ මුදලින් රු. 230,797 ක මුදල යටියන්තොට විකාශනාගාරයේ විදුලි බිල්පතට අදාළ දඩ මුදල් වටිනාකම වේ. මෙය හිඟ විදුලි බිලකට අදාලව සිදු කරන ලද දඩ මුදලක් වන අතර එය මාසිකව බිල් පතට ඇතුලත් කර ඊළඟ මස බිල්පතින් එම දඩ මුදල අඩුකර ඇති බැවින් මෙම රු. 230,797 ක දඩ මුදල ගෙවා නොමැත. එලෙසම නායබැද්ද හා හුන්නස්ගිරියට අදාළ දඩ මුදල්ද ගෙවා නොමැත.<br><br>නමුත් වික්‍රමසිංහපුර ප්‍රධාන කාර්යාලයට අදාළ මෙම දඩ මුදල 2020 මැයි මස රු. 51,757 ක් සහ ජුනි මස රු. 55,092 ක් වශයෙන් වේ. මෙම කාලපරිච්ඡේදය තුලදී රටේ පැවති කෝවිඩ් තත්වය හේතුවෙන් බිල්පත් ලැබීමේ ප්‍රමාදයත්, ආයතනය තුල පැවති මූල්‍ය අර්බුදකාරී තත්වයත් හේතුවෙන් ගෙවීමට දින කිහිපයකින් ප්‍රමාද වීම නිසා දඩ මුදල් අයකර තිබුණි.ඒ අනුව එම 2020 මැයි සහ ජුනි මාස වලට අදාළ දඩ මුදල් ගෙවීමට සිදුවිය. | විදුලි බිල්පත් නියමිත කාලය තුළ ගෙවිය යුතුය. |

**3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ**

---

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලය විසින් 2015 වර්ෂයේ මිලදීගත් රු. 1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් මිලදී ගත් දින සිට සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද පිරිවැය රු. 1,218,274 ක් වූ ArosFlexus FT- 30 ,30KVA UPS Systems වසර 03 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි. | 2015 වර්ෂයේ මිලදී ගත් Hot Swappable Power distribution rack එක සම්බන්ධවයි. මෙම විදුලිය බෙදා හැරීමේ පුවරුව 2015 දී ආයතනයට ලැබුනද එහි මිලදී ගැනීම් කටයුතු සිදු කෙරුනේ 2014 වසරේදීය. එම කාලය තුල ආරම්භ වූ ව්‍යාපෘතියකට අනුව යටිතල පහසුකම් සකස් කිරිම සඳහා මෙම මිලදී ගැනීමේ කටයුතු සිදු කරනු ලැබූ අතර, 2015 පත්වූ නව රජයේ ප්‍රතිපත්ති අනුව එම කාලය තුලදී පටන් ගත් බොහෝ ව්‍යාපෘති ඉදිරියට ගෙන යාමට අවශ්‍ය අනුමැතීන් නොලැබීම හා මුදල් වෙන් නොකිරීම නිසා මෙම Disaster Recovery Server Room ව්‍යාපෘතියද අතරමග | වත්කම් නිසි අන්දමින් උපයෝජනය කල යුතුය. |

නැවතුනු අතර එය ආරම්භ කොට ක්‍රියාත්මක කල ඉංජිනේරුවන් පවා ආයතනයෙන් ඉවත් විය. ඉන්පසු ඒ ව්‍යාපෘතිය වසර ගණනාවක් අකර්මන්‍යව පැවති අතර, එකල සවිකල උපකරණ තාවකාලික මට්ටමේ ස්ථාපනය කල අතර, ඒවා එලෙසම පවතී.පසුව එම Server Room එක ප්‍රධාන ගොඩනැගිල්ලේ කොටසකට ස්ථාපනය කිරීමට නව පරිපාලනය එකඟ වූ අතර එම පරිශ්‍රය Server Room එකට අවශ්‍ය ආකාරයට සකස් කොට සියලුම සිවිල් වැඩ අවසන් කොට අදාල Hot Swappable Power distribution rack ස්ථාපනයකරන ලදී,මේසම්බන්ධව අමාත්‍යාංශ නිලධාරීන් කිහිප දෙනෙක් පැමිණ විමර්ශනය කරන ලදී.අදාල උපකරණ ලැබුණු විගස විදුලිය සම්බන්ධ කිරීමේ හැකියාව පවතී.කොවිඩ් ව්‍යසනය නිසා ආයතනයේ මූල්‍ය තත්වය සතුටුදායක නොවන බැවින් අත්‍යවශ්‍යම නොවන සියලුම මිලදී ගැනීම් හා ව්‍යාපෘති මේ වනවිට තාවකාලිකව නවතා ඇත.

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස්දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මාධ්‍ය ජාලයේ සභාපතිවරයාගේ ප්‍රයෝජනය සඳහා කුලී පදනම මත වාහනයක් සපයා ගැනීම පිළිබඳ පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 මාර්ගෝපදේශය අනුව,වෙළඳපල සැදැහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමේ දී ආයතනයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවිය යුතු වුව ද, ආයතනයේ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන්මිල ගණන් කැඳවීම් සිදු කර නොතිබුණු අතර වෙනත් බාහිර ආයතන 09 කින් මිල ගණන් කැඳවා තිබුණි. | යථෝක්ත කරුණ සම්බන්ධයෙන් මිල කැඳවීමට අදාළව සැපයුම්කරුවන් ආයතනයේ ලියාපදිංචි වී නොමැති වීම හේතුවෙන්, ප්‍රවාහන අංශ ප්‍රධානී විසින් මිල කැඳවීමට නිර්දේශ කරන ලද ආයතන 08 ක් සඳහා ඇගයීම් කමිටුවේ නිර්දේශ හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව වෙළඳපල සැදැහුම් ක්‍රමය යටතේ මිල කැඳවීම කර ඇත. 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යටතේ 3.4.5 මාර්ගෝපදේශය අනුව දුරකථන නාමාවලි වල Yellow Pages සහ Rainbow Pages යටතේ ලියාපදිංචි වී ඇති ආයතනයන්ගෙන් ද වෙළඳපල සැදැහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමට ප්‍රතිපාදන සලසා ඇති අතර, ප්‍රවාහන අංශ ප්‍රධානී විසින් මිල කැඳවීමට නිර්දේශ කරන ලද ආයතන බොහොමයක් එසේ Rainbow Pages යටතේ ලියාපදිංචි වී ඇති ආයතන විය. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | **මිලකැඳවීම් යොමු කළ ආයතන 09 අතුරින් එක් ආයතනයක් මිල කැඳවීම් ලිපිය භාර ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර,පළමු සැපයුම්කරුවන් යෝජනා කිරීමෙන් දින 11කට පසු එනම් 2020 සැප්තැම්බර් 22 දින ඉහත මිල කැඳවීම ප්‍රතික්ෂේප කල ආයතනය වෙනුවට වෙනත් ආයතනයක් යෝජනා කර එම ආයතනයෙන් මිල ගණන් ලබා ගැනීමට ප්‍රවාහන අංශ ප්‍රධානී විසින් අනුමැතිය ඉල්ලා තිබුණි.මිල කැඳවීම් ලිපි ඉදිරිපත් කල ආයතන 09 අතුරින් 08 ක් එම ලිපි භාරගෙන තිබිය දී ,එම මිල ගණන් සලකා බැලීමට කටයුතු කිරීමට වෙනුවට පළමු මිල කැඳවීම සිදු කර දින 11 කට පසු වෙනත් ආයතනයක් යෝජනා කිරීම සහ නිර්දේශ කිරීම ,මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවය පිළිබඳ මතභේදයකට තුඩු දෙන කරුණකි.** | **2020 සැප්තැම්බර් 18 දින මිල කැඳවීම් යොමු කළ ආයතනයන් 08 අතුරින් එක් ආයතනයක් මිල කැඳවීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර, ප්‍රධාන විධායක නිලධාරිගේ අනුමැතිය සහිතව ප්‍රවාහන අංශ ප්‍රධානිගේ 2020 සැප්තැම්බර් 22 ලිපිය මගින් එම ආයතනය වෙනුවට මිල කැඳවීමට වෙනත් ආයතනයක් යෝජනා කර තිබූ අතර, 2020 සැප්තැම්බර් 22 දින එම ආයතනයෙන් ද මිල කැඳවීමක් කර ඇත. 2020 සැප්තැම්බර් 19,20 දිනයන් සති අන්තයක් වූ බැවින් වැඩකරන දින 02 ක් ඇතුලතදී එම මිල කැඳවීම සිදු කර අතර මිල කැඳවා ඇත්තේ දින 11 කට පසුව යැයි සඳහන් කිරීම සාවද්‍යා වේ.** | **ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය.** |
| **(iii)** | **මෙම ආයතනයේ සේවාව සපයා ගැනීම සඳහා 2020 සැප්තැම්බර් 22 දින ප්‍රවාහන අංශ ප්‍රධානී විසින් යෝජනා කර ඉදිරිපත් කර තිබුණු ද ඊට දින 4 කට පෙර එනම් 2020 සැප්තැම්බර් 18 දින අදාල ලංසු ආරාධනා කිරීමේ ලිපිය එකී යෝජිත ආයතනය වෙත භාර දී තිබුණි.** | **ප්‍රවාහන අංශ ප්‍රධානිගේ 2020 සැප්තැම්බර් 22 ලිපිය අනුව අදාළ විෂය භාර නිලධාරිනිය විසින් මුල් මිල කැඳවුම් කළ ලිපියෙන් පිටපතක් ගෙන පසුව යෝජනා කළ ආයතනය වෙත මිල කැඳවීමක් කර තිබූ බැවින් එම ලිපියේ දිනය 2020 සැප්තැම්බර් 18 දින ලෙස සටහන් වී ඇත.** | **ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය.** |
| **(iv)** | **මෙම ආයතනය පෞද්ගලික සමාගමක් ලෙස 2020 සැප්තැම්බර් 21 දින ලියාපදිංචි කර තිබුණු අතර ඊට පසු දින එනම් 2020 සැප්තැම්බර් 22 දින යෝජනා කර නිර්දේශ කර අනුමත කර තිබුණි.** | **මිල ගණන් කැඳවන සැප්තැම්බර් 22 වන විට එම ආයතනය ලියාපදිංචි කර තිබූ ආයතනයක් බැවින් එම මිල කැඳවීම අනුමත කරන ලදී.** | **ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය.** |
| **(v)** | **මෙම ආයතනය ඡායාරූපකරණයෙහි නිරතවන,ටෙලි නාට්‍ය චිත්‍රපට නිෂ්පාදන සම්බන්ධව කටයුතු කරනු ලබන චිත්‍රාගාර,කැමරා උපකරණ ආදියෙන් යුක්ත ආයතනයක් වන අතර ප්‍රවාහන සේවා සපයන ආයතනයක් නොවන බව මෙම ආයතනයේ වෙබ් අඩවිය පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය විය.** | **වාහන සැපයීමද ව්‍යාපාරයක් වශයෙන් සිදු කරනු ලබන බැවින් ආයතයට වඩාත් වාසිදායක වන මිල ගණන් ලබා ගැනීම සලකා ඔවුනටද මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දී ඇත.** | **ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය.** |

| | | |
|---|---|---|
| **(vi)** ලංසුකරුවන් **06** ක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර ඉන් අඩුම ලංසුව අවශ්‍යතාවයට නොගැලපෙන බව දක්වමින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර දෙවන අඩුම ලංසුව ඉදිරිපත් කල ආයතනය විසින් සැපයීමට අපේක්ෂිත වාහනය හදිසි අනතුරකට භාජනය වීම හේතුවෙන් තෙවන අඩුම ලංසුව ඉදිරිපත් කල ඉහත ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට **2020** ඔක්තෝබර් **23** දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දී තිබුණි. | ඇගයීම් කමිටුවේ නිර්දේශ මත කොන්ත්‍රාත්තුව පිරිනැමීමට **2020** ඔක්තෝබර් **23** දින ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබා දී ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය. |
| **(vi)**තෙවන අඩුම ලංසුව ඉදිරිපත් කර තිබුණු ආයතනය ලෙස ඉහත ආයතනය වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය සඳහා ප්‍රසම්පාදන කමිටු අනුමැතිය **2020** ඔක්තෝබර් **23** දින ලබා දී තිබුණ ද තම ආයතනය තෝරා ගැනීම පිළිබඳව ස්තූතිය පල කරමින් එකී ආයතනයවිසින් **2020** ඔක්තෝබර් **09** දින මාධ්‍ය ජාලයේ ප්‍රධාන විධායක නිලධාරී වෙත ලිපියක් එවා තිබුණි.මෙසේ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අනුමැතිය දීමට පෙර කොන්ත්‍රාත්ලාභී විසින්තම ආයතනය ඒ සඳහා සුදුසුකම් ලැබූ බවට තීරණය කිරීම විගණනයේ දී ගැටළු සහගත විය. | මෙම ලිපිය සැපයුම්කරු විසින් **2020.10.09** දින ඉදිරිපත් කර තිබූ අතර ඒ වනවිටත් මෙම ටෙන්ඩරය ඇගයීම් කටයුතු සිදු කරමින් පැවති අතර ටෙන්ඩරය ප්‍රදානය පිළිබඳ කිසිදු තීරණයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම සැපයුම්කරු විසින් අනවබෝධය මත මෙම වගන්තිය ලිපියට ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය වේ. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය. |
| **(viii)** තවද දෙවන හා තුන්වන ලංසුකරුවන් ආයතන දෙකක් වශයෙන් ලංසු ඉදිරිපත් කර තිබුණද , තෙවන ලංසුව ඉදිරිපත් කල ආයතනයවිසින් අනතුරට ලක්වූ රථය වෙනුවට වෙනත් රථයක් වෙන් කර ඇති බවටද ඉහත ලිපිය මගින් දන්වා තිබුණි. ඒ අනුව දෙවන හා තුන්වන අවම ලංසු ඉදිරිපත් කල ආයතන දෙකෙහි අනන්‍යතාවය විගණනයේදී ගැටලු සහගත විය. | ඇගයීම් කමිටු වාර්තාව අනුව අවම මිල ඉදිරිපත් කළ ආයතනයට පිරිවිතර වලට නොගැලපෙන බැවින් නිර්දේශ කර නොමැත. දෙවන අවම මිල ඉදිරිපත් කර ඇති සැපයුම්කරුගේ වාහනය අනතුරකට ලක්වී ඇති බැවින් එය ලබා දීමට කාලයක් ගත වන බව දන්වා ඇති බැවින් එම මිල ගණනද නිර්දේශ කර නොමැත. එය ඡායාරූප මඟින් තහවුරු කර ඇත. ඒ අනුව තෙවන අවම මිල ගණන ඉදිරිපත් කළ ආයතනය ටෙන්ඩර් ප්‍රදානය සඳහා ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කර ඇත. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය. |
| **(ix)** ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලැබීමට හා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර මාධ්‍ය ජාලය විසින් මෙම වාහනය සේවයේ යොදවා තිබුණු අතර **2020** ඔක්තෝබර් **15** | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසාන කර වාහනයක් සේවය සඳහා යෙදවීමට ප්‍රමාද වන බැවින් හදිසි අවශ්‍යතාවය මත සෘජු ප්‍රසම්පාදනයක් ලෙස සීමිත කාලයකට සේවය ලබා ගෙන ඇත.ඉහත මිල කැඳවීමේදී උපරිම පාරදෘශ්‍ය භාවය ආරක්ෂා | ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් භාවයෙන් යුක්ත විය යුතුය. |

| | | |
|---|---|---|
| දින සිට **2020** ඔක්තෝබර් **28** දින දක්වා කාලය තුල ලබාගත් සේවය වෙනුවෙන් මාධ්‍ය ජාලය විසින් රු. **123,662** ක් වැය කර තිබුණි. | වන පරිදි තරගකාරී මිල ගණන් ලබා ගැනීමට ක්‍රියා කර ඇති අතර, මුද්‍රා තබන ලබන මිල ගණන් සැපයුම්කරුවන්ද සහභාගී වූ ලංසු විවෘත කිරීමේ කමිටුවක් ඉදිරියේ විවෘත කිරීම සිදු කර ඇති බව දන්වමි. | |

**3.6** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2018** මැයි **8** දිනැති කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ **DMS/1590/Vol- II** දරන ලිපිය මගින් සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සඳහා කාර්ය මණ්ඩලය අනුමත කර තිබුණු අතර එම අනුමැතිය ප්‍රකාරව යෝජිත බඳවා ගැනිමේ පටිපාටි පිළියෙල කර තිබුණ ද එය අනුමත කර ගැනීම සඳහා **2020** දෙසැම්බර් **31** දින වනවිටද කටයුතු කර නොතිබුණි. | බඳවාගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන ඇති අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා අනුමැතිය ලබාදීමට මේ දක්වා කටයුතු කර නොමැති බව කාරුණිකව දන්වමි. | බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීම සඳහා නොපමාව කටයුතු කළ යුතුය. |
| (ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ **2018.05.08** දිනැති අංක **DMS/1590/Vol-II** දරණ ලිපියේ **05** ඡේදය අනුව නව බඳවා ගැනීම් සිදු කිරීමේ දී එම තනතුරු වලට අදාළ බඳවා ගැනිමේ හා උසස් කිරිමේ පරිපාටි සංශෝධනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනිමෙන් පසුව පමණක් බඳවා ගැනිම් සිදුකල යුතු වුව ද ඒ අනුව කටයුතු කිරීමෙන් තොරව මාධ්‍ය ජාලය විසින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබු නව තනතුරු **03** ක් සඳහා බඳවා ගැනීම් සිදුකර තිබුණි. | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සාංගමික ව්‍යවස්ථාව අනුව සේවා අවශ්‍යතාවය මත සේවකයන් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලතල ලබාදී ඇති අතර සේවා අවශ්‍යතාවය මත පත් කිරීම් සිදු කර ඇත. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) මාධ්‍ය ජාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර සඳහා පෞද්ගලිකව ලද ඉල්ලුම් පත්‍ර මත පදනම්ව පුද්ගලයන් **5** දෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ඉන් එක් පුද්ගලයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර බඳවාගන්නා ලද නිලධාරියා විසින් සපුරා ඇති අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් සහ පලපුරුද්ද සනාථ කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර නොතිබුණි. මාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ලබාදී මෙම තනතුර සඳහා වඩාත්ම සුදුසු පුද්ගලයෙකු තෝරා ගෙන ස්ථිර පදනමකින් බඳවා ගැනිමට කටයුතු කර නොතිබුණු අතර මෙම බඳවා ගැනිමේ | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ සාංගමික ව්‍යවස්ථාව අනුව සේවා අවශ්‍යතාවය මත සේවකයන් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට බලතල ලබාදී ඇති අතර සේවා අවශ්‍යතාවය මත පත් කිරීම් සිදු කර ඇත. | බඳවා ගැනීමේ කටයුතු විනිවිදභාවයෙන් යුක්තව සිදුකර තනතුරට වඩාත්ම සුදුසු පුද්ගලයා තෝරා බඳවා ගැනීමට කටයුතු කලයුතු අතර,පුද්ගලික ලිපිගොනු නිසි පරිදි පවත්වා ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| කටයුතුවල විනිවිදභාවය විගණනයේදී ගැටළු සහගත විය. | | |
| (ඈ) අංක DMS/1590/Vol-II හා 2018 මැයි 08 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සීමාසහිත ස්වාධින රූපවාහිනී මාධ්‍ය ජාලයට කාර්යමණ්ඩලය අනුමත කිරිම් ලිපියේ 6 වන ඡේදය අනුව , නව බඳවා ගැනිමේ පරිපාටි අනුව අන්තර්ග්‍රහණය කිරිමේ සුදුසුකම් නොමැති සේවක පිරිස් සඳහා ඔවුන්ට පෞද්ගලිකවනසේ දැනට සිටින තනතුර පවත්වාගෙන යා යුතු අතර එම තනතුර දරන්නා වෙනත් තනතුරකට උසස් කිරිමෙන් හෝ විශ්‍රාම යාමෙන් පසු එම තනතුර අහෝසි විය යුතුය.එසේ වුවද ඊට පටහැනිව මාධ්‍ය ජාලය විසින් 2020 වර්ෂයේ දී නිලධාරින් 56 දෙනෙකු එම තනතුරු සඳහා බඳවාගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර නොමැති බැවින් විධිමත් පරිදි සේවකයින් ඒ ඒ තනතුරු සඳහා අන්තර්ග්‍රහණය කිරීමක් සිදු කර නොමැත.<br>අංක DMS / 1590 / vol – ii හා 2018 මැයි 08 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ස්වාධීන රූපවාහිනි මාධ්‍ය ජාලයට කාර්ය මණ්ඩලය අනුමත කිරීම් ලිපියේ 06 වන ඡේදයට පටහැනි වන ලෙස තනතුරු සඳහා සේවකයින් බඳවාගෙන නොමැත. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් අනුව කටයුතු කල යුතුය. |
| (ඉ) මාධ්‍ය ජාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුල ඇතුලත් තනතුරු සඳහා ස්ථිර වශයෙන් නිලධාරින් පත්කර ගැනිමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරින් 34 ක් බඳවා ගැනීමටත් අනුමත නොවන තනතුරු 4 ක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමටත් කටයුතු කර තිබුණි. | මේ සම්බන්ධයෙන් විගණන විමසුම් අංක එම්ඊඩී/බී/අයිටීඑන්/2020/බී/වී වී.04 හි අංක 7 (අ) හා (ආ) යටතේ දක්වා ඇති විස්තර අදාළ වේ. | ස්ථිර කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහා ස්ථිර නිලධාරින් බඳවා ගැනීම් කළ යුතුය. |